**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2014 ජුලි 31 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 22 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 11 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 මතය**
**------**

මෙම වාර්තාවේ 1.3 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-----------------------------------------**

**1.3.1 නොසැසදූ පාලන ගිණුම්**
**--------------------------**

මූල්‍ය ප්‍රකාශන අනුව විවිධ තැන්පත් හා සේවක ණය යන ගිණුම් විෂයයන්ට අදාල එකතුව රු.63,026,720 ක් වුවද උපයෝගී ලේඛණ අනුව එම එකතුව රු.34,163,741 ක් වීම නිසා රු.28,862,979 ක නොසැසඳුන වෙනසක් අනාවරණය විය.

1.3.2 **අවිනිශ්චිත ගිණුම**
---------------------

සභාව විසින් ලංකා බැංකුවේ වෙන්නප්පුව ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක 0001865986 දරණ ජංගම ගිණුමට අදාලව 2013 දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශය තුල වූ රු. 384,122 ක අවිනිශ්චිත ශේෂය නිරවුල් කිරීමට හෝ ඒ පිළිබඳ පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**
---------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 188,259,239 ක් වූ ගනුදෙනු සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ, පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.26,359,024 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 42,600,136 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත ආදායම් | තථ්‍ය ආදායම් | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු000. | රු000. | රු000. |
| (අ) | වරිපනම් හා බදු | 9,250 | 7,988 | 5,729 |
| (ආ) | බදු කුලී | 29,515 | 29,336 | 2,251 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 4,004 | 4,044 | 8,410 |
| (ඇ) | වෙනත් ආදායම් | 5,940 | 11,935 | 1,753 |

#### 2.2.2 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු අයකිරීමේ ප්‍රගතිය සියයට 86 ක් වූ අතර, වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ප්‍රමාණය පෙර වර්ෂයට සාපේක්ෂව වැඩිවී තිබුණි. දංකොටුව හා කම්මල්පත්තුව උප කාර්යාලවල වරිපනම් බදු බිල් කිරීම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.270,543 ක් අඩුවෙන් සිදු කර තිබුණි.

#### 2.2.3 දේපළ බදුදීම

(අ) සමාලෝචිත වර්ෂයේ සභාව සතු දේපල බදු දීමේදී මිළගණන් ඉදිරිපත් නොකරන ලද දේපල අවම ලංසුවෙන් සියයට 25 ක් අඩුකර නැවත බදු දීමට පළාත් පාලන කොමසාරිස්වරයා අනුමත කර තිබුණද, එම දේපල බදු දීමට කටයුතු කර නොතිබුණි. එම නිසා සභාවට අහිමි වූ ආදායම රු. 1,694,265 ක් විය.

(ආ) වෙන්නප්පුව වෙළඳ සංකීර්ණයේ වර්ග අඩි. 4440 කින් යුක්ත උඩුමහල වර්ෂ 2 ක කාලයක සිට බදුදීමකින් තොරව වෙළඳ සංගම් සඳහා ලබා දී තිබීමෙන් සභා අරමුදලට ලබාගත හැකිව තිබූ ආදායම් අත්හැරී තිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | | රු. |
|---|---|---|---|
| (i). | උසාවි දඩ | - | 6,491,943 |
| (ii). | මුද්දර ගාස්තු | - | 153,906,250 |

**2.3. අධිභාර**

---------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුළ පනවන ලද අධිභාර සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු. 326,335 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. එමෙන්ම ඉදිරියේදී රු. 340,423 ක් සම්බන්ධයෙන්
අධිභාර පියවර ගැනීමට යෝජිතව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

**3.1 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

----------------------------------------------------

නියැදි විගණන පරික්ෂණවලදී අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ
.

(අ) වයඹ පළාත් සභාවෙන් පරිත්‍යාගයක් ලෙස ලබාදී තිබූ අංක 28- 2537 දරණ හීනෝ රථයේ වටිනාකම තක්සේරු කර නොතිබූ අතර, එය ප්‍රයෝජනයට ගත නොහැකිව අබලි තත්ත්වයෙන් 1997 වර්ෂයේ සිට වෙන්නප්පුව උසාවි භූමියේ ගාල්කර අත්හැර දමා තිබුණි.

(ආ) වසර කිහිපයකට පෙර අළුත්වැඩියාව සඳහා පෞද්ගලික ආයතනයක් වෙත යවා තිබූ රු. 2,490,000 ක් වටිනා JCB යන්ත්‍රය ආපසු ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 **කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කසල අපහරණය කොන්ත්‍රාත් පදනම මත ඉටුකිරීමට ප්‍රථම සභාවේ සෞඛ්‍ය කම්කරුවන් ප්‍රමාණය ඉවත් කිරීම හෝ අඩුකිරීමට කටයුතු නොකර 2012 අවසානය වන විට අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා කණිෂ්ඨ කාර්ය මණ්ඩලයට 136 දෙනෙකු බඳවාගෙන තිබුණි. කසල අපහරණය කොන්ත්‍රාත් පදනමින් ඉටුකිරීම නිසා ඔවුන් නිශ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නිරීක්ෂණය වූ අතර, ඍජු ශ්‍රම පදනම මත කසල ඉවත් කිරීමට සභාව අවධානය යොමු කර නොතිබුණි. තවද කොන්ත්‍රාත්කරු එකඟ වූ ගිවිසුමට පටහැනිව ඉන්ධන ලබාදීම නිසා සභාවට රු. 1,134,586 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ඍජු ඉදිකිරීම් යටතේ කැරන්වත්ත නව ජනපදය මැද පාර සහ බොරලැස්ස තිනගාර ගාලවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීමට මිළදී ගෙන තිබූ ද්‍රව්‍යවලට පළාත් මිළ කමිටුවේ අනුමත ගාස්තු ඉක්මවා ගෙවීම් කර තිබීමෙන් සභා අරමුදලට රු.26,820 ක පාඩුවක් සිදුව තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරුවන්ට පැවරූ කර්මාන්ත 06 ක් ප්‍රමාද වී ඉටුකිරීම වෙනුවෙන් අයකළ යුතු ප්‍රමාද ගාස්තු රු. 42,856 ක් අයකරගෙන නොතිබුණි.

(ඈ) බාහිර කොන්ත්‍රාත්කරුවෙකු ලවා ඉටුකරවාගෙන තිබූ හාල්දඩුවන ගිනිගල්පල මාර්ගය තාර දැමීමේ කර්මාන්තයේ නියමිත දුර හා පළල අඩුවෙන් ඉටුකිරීම නිසා සභාවට රු. 17,930 ක පාඩුවක් සිදුව තිබුණි

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------------**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට රු. 42,300 ක් වටිනා අගරු චෙක්පත් දෙකකට අදාල මුදල් අයකර ගෙන නොතිබුණි.

(ආ) ඉඩම් කට්ටිකර විකිණීමේදී පොදු පහසුකම් වෙනුවෙන් සභාවට පවරා තිබූ ඉඩම් කට්ටි සමීක්ෂණය කර අයිතිය හා ආරක්ෂාව තහවුරු කරගෙන නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) කොන්ත්‍රාත් පාලනය
(ඉ) ණයගැති හා ණයහිමි පාලනය
(ඊ) වත්කම් කළමනාකරණය
(උ) සේවක ණය